# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2009 අංක 37 දරන මාර්ග සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 ජූලි මස 23 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 ජූලි මස 24 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 6.50 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

## 2009 අංක 37 දරන මාර්ග සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2009 ජූලි මස 23 වන දින]

එල්. ඩී.—ඕ. 34/2007.

### මාර්ග සංවර්ධන අධිකාරිය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2009 අංක 37 දරන මාර්ග සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1981 අංක 73 දරන මාර්ග සංවර්ධන අධිකාරිය පනතේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 1981 අංක 73 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

"(1) අධිකාරිය පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය:—

(අ) සිවිල් ඉංජිනේරු, මහාමාර්ග ඉංජිනේරු, වාණිජ මූල්‍ය, නීති හෝ පරිපාලන ක්ෂේත්‍රවල මනා පළපුරුද්දක් ඇති සහ හැකියාවක් දක්වා ඇති තැනැත්තන් අතරින් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු (මෙහි මින් මතු "පත්කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) සාමාජිකයන් සත්දෙනකු ; සහ

(ආ) (මෙහි මින් මතු "නිල බලයෙන් පත් වූ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) පහත දැක්වෙන නිලයන් දරන වෙනත් සාමාජිකයන් නව දෙනකු:—

(i) මහාමාර්ග විෂයයභාර අමාත්‍යාංශය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයකු;

(ii) මුදල් විෂයයභාර අමාත්‍යාංශය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයකු;

(iii) බලශක්ති විෂයයභාර අමාත්‍යාංශය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයකු;

(iv) ප්‍රවාහන විෂයයභාර අමාත්‍යාංශය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයකු;

(v) ඉඩම් විෂයයභාර අමාත්‍යාංශය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයකු;

(vi) 1974 අංක 2 දරන ජාතික ජල සැපයුම් සහ ජලප්‍රවාහ මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ජාතික ජල සැපයුම් සහ ජලප්‍රවාහ මණ්ඩලය විෂයයභාර අමාත්‍යවරයා විසින් නම් කරන ලද එකී මණ්ඩලයේ සාමාන්‍යාධිකාරීවරයා;

(vii) 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත යටතේ පිහිටුවන ලද නාගරික සංවර්ධන අධිකාරිය විෂයයභාර අමාත්‍යවරයා විසින් නම් කරන ලද එකී අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා;

(viii) 1980 අංක 47 දරන ජාතික පරිසර පනත යටතේ පිහිටුවන ලද මධ්‍යම පරිසර අධිකාරිය විෂයයභාර අමාත්‍යවරයා විසින් නම් කරන ලද එකී අධිකාරියේ ප්‍රධාන විධායක නිලධරයා; සහ

(ix) 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත යටතේ පිහිටුවන ලද භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය විෂයභාර

අමාත්‍යවරයා විසින් නම් කරන ලද එකී කාර්යාංශයේ ප්‍රධාන විධායක නිලධරයා.

(2) ඒ වගන්තියේ (11) වන උපවගන්තියේ (ආ) ඡේදය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:—

"(ආ) ඔහු නිලබලයෙන් පත් වූ සාමාජිකයකු නම් ඒ සාමාජිකයා පත් කළ අමාත්‍යවරයා විසින් ඒ සාමාජිකයා වෙනුවට කටයුතු කිරීමට වෙනත් තැනැත්තකු නම් කළ හැකි ය."

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(1) (අ) (මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත මාර්ග සංවර්ධන උපදේශක සභාවක් පිහිටුවනු ලැබිය හැකි ය:—

(i) සභාවේ සභාපතිවරයා විය යුතු මහාමාර්ග විෂයයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් ධුරය දරන තැනැත්තා;

(ii) පරිසර සහ ස්වභාවික සම්පත් විෂයයභාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයකු;

(iii) විදුලි සංදේශ විෂයයභාර අමාත්‍යාංශය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයකු;

(iv) පළාත් පාලන විෂයයභාර අමාත්‍යාංශය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයකු;

(v) රජයේ ඉඩම් විෂයයභාර අමාත්‍යාංශය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයකු;

(vi) ප්‍රවාහන විෂයයභාර අමාත්‍යාංශය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයකු;

(vii) මුදල් විෂයයභාර අමාත්‍යාංශය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයකු;

(viii) සභාවේ ලේකම්වරයා ලෙස කටයුතු කළ යුතු තත්කාලයේ අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ ධුරය දරන තැනැත්තකු;

(ix) 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත මගින් පිහිටුවන ලද නාගරික සංවර්ධන අධිකාරියේ තත්කාලයේ අධ්‍යක්ෂ ජනරාල් ධුරය දරන තැනත්තා හෝ ඔහුගේ අනුයෝජිතයකු;

(x) 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනත මගින් පිහිටුවන ලද ලංකා විදුලිබල මණ්ඩලයේ තත්කාලයේ සාමාන්‍යාධිකාරි ධුරය දරන තැනැත්තා හෝ ඔහුගේ අනුයෝජිතයකු;

(xi) 1974 අංක 2 දරන ජාතික ජල සැපයුම් සහ ජලප්‍රවාහ මණ්ඩලය පනත මගින් පිහිටුවන ලද ජාතික ජල සැපයුම් සහ ජලප්‍රවාහ මණ්ඩලයේ තත්කාලයේ සාමාන්‍යාධිකාරී ධුරය දරන තැනැත්තා හෝ ඔහුගේ අනුයෝජිතයකු; සහ

(xii) මහාමාර්ග ඉංජිනේරු, කළමනාකරණ හෝ පරිපාලන, නීතිය හෝ මුල්‍ය ක්ෂේත්‍රවල මනා පළපුරුද්දක් ඇති සහ හැකියාවන් දක්වා

ඇති බවට පෙනී යන තැනැත්තන් අතරින් අමාත්‍යවරයා විසින් පත් කරන වෙනත් සාමාජිකයන් හතර දෙනකු;

(ආ) මේ ඡේදය යටතේ පත් කළ සාමාජිකයකු මින්මතු මේ වගන්තියේ "සභාවේ පත් කළ සාමාජිකයකු" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

(2) සභාවේ කර්තව්‍යයන් පහත දැක්වෙන පරිදි විය යුතු ය:—

(අ) මාර්ග ප්‍රතිපත්තිය, මාර්ග පර්යේෂණ, මාර්ග සැලසුම් සහ ක්‍රමෝපායන් සහ මාර්ග සංවර්ධනය පිළිබඳ අමාත්‍යවරයාට උපදෙස් දීම; සහ

(ආ) අවස්ථාවෝචිත පරිදි අමාත්‍යවරයා විසින් හෝ අධිකාරිය විසින් සභාව වෙත යොමු කරනු ලැබිය හැකි අධිකාරියේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය කිසිවක් ක්‍රියාත්මක කිරීම, සිදු කිරීම හෝ ඉටු කිරීමට අදාළ කාරණා කිසිවක් පිළිබඳ අවස්ථාවෝචිත පරිදි අමාත්‍යවරයා වෙත හෝ අධිකාරිය වෙත උපදෙස් ලබාදීම.".

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

"අධිකාරියේ බලතල කාර්යය සහ කර්තව්‍ය.

9. (1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව කිසියම් සංවර්ධන ප්‍රදේශයක් තුළ අධිකාරියේ බලතල කාර්යය සහ කාර්තව්‍යයන්:—

(අ) කලින් කලට අමාත්‍යවරයා විසින් අධිකාරියට දෙනු ලැබිය හැකි විධාන කිසිවකට යටත්ව ඒ ඒ ප්‍රදේශවල ඒකාබද්ධ මාර්ග සැලසුම් සහ මාර්ග සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම;

(ආ) අමාත්‍යවරයා විසින් කලින් කලට අධිකාරියට දෙනු ලැබිය හැකි විධාන කිසිවකට යටත්ව ඒකාබද්ධ මාර්ග සැලසුම් ඇතුළත් වන ඒ ප්‍රදේශවල මාර්ග සංවර්ධන වැඩ, කාර්යය සහ සේවා වලට අදාළ අනෙකුත් ආනුෂංගික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම;

(ඇ) රජය විසින් අනුමත කිරීම සඳහා මූලික ප්‍රාග්ධන සැලසුම් ඇතුළත් කරමින් මාර්ග සංවර්ධන සැලසුම් නිර්මාණය කර අමාත්‍යවරයා වෙත භාර දීම ;

(ඈ) රජය විසින් අනුමත කරනු ලබන මාර්ග නඩත්තු කිරීම සහ මාර්ග සංවර්ධන ව්‍යාපෘති සහ යෝජනාක්‍රම ක්‍රියාත්මක කර පවත්වාගෙන යාම ;

(ඉ) රජය විසින් අනුමත කරනු ලබන මාර්ග සංවර්ධන ව්‍යාපෘති හෝ යෝජනාක්‍රම කිසිවක් කරගෙන යාමේ කාර්යය සඳහා, ඍජුව හෝ රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාරයක් හෝ ඒකාබද්ධ ව්‍යාපාරයක් මාර්ගයෙන් හෝ ශ්‍රී ලංකාවේ හෝ ඉන් බැහැර කිසියම් තැනැත්තකු සමග අවශ්‍ය විය හැකි යම් කොන්ත්‍රාත් සහ ගිවිසුම්වලට ඇතුළත් වීම, ඒවා ක්‍රියාත්මක කිරීම සහ කරගෙන යාම ;

(ඊ) යම් මාර්ග සංවර්ධන ව්‍යාපෘතියක් හෝ යෝජනා ක්‍රමයක් සම්පූර්ණ කිරීමට අපොහොසත් වීම හෝ යම් තැනැත්තකු විසින් පැහැර හැර ඇති විටදී ඒ ව්‍යාපෘතිය හෝ යෝජනාක්‍රමය සම්පූර්ණ කිරීමට භාර ගැනීම ;

(උ) රජය විසින් අනුමත කරන ලද මාර්ග සංවර්ධන සැලසුම් සහ ප්‍රාග්ධන ආයෝජන සැලසුම් ක්‍රියාත්මක කිරීම ;

(උඉ) අදාළ සංවර්ධන ප්‍රදේශවල ප්‍රධාන මාර්ග නගා සිටුවීමේ වැඩසටහන් සකස් කිරීම ;

(එ) චංචල හෝ නිශ්චල දේපළ කිසිවක් අත්කර ගැනීම, හෝ මිලට ගැනීම සහ දැරීම හෝ අත්කරගත් හෝ දරන චංචල හෝ නිශ්චල දේපළ කිසිවක් නීයාදනය කිරීම හෝ බද්දට දීම;

(ඒ) යම් රජයේ නියෝජ්‍යායතනයක ඉල්ලීම මත, ඒ නියෝජ්‍යායතනය උදෙසා මාර්ග සංවර්ධන ව්‍යාපෘති සහ සැලසුම් යෝජනාක්‍රම සකස් කිරීම සහ ව්‍යාපෘති හෝ යෝජනාක්‍රම ක්‍රියාවේ යෙදවීමේ දී ඒවා සමායෝජනය කිරීම හෝ ඒවාට සහාය වීම ;

(ඔ) අදාළ සංවර්ධන ප්‍රදේශවල වූ රජයේ නියෝජ්‍යායතන හෝ වෙනත් තැනැත්තන්ගේ සුභසිද්ධිය පිණිස මාර්ග සැලසුම් සේවා සැපයීම ;

(ඕ) අධිකාරිය විසින් සපයන සේවා කිසිවක් සඳහා ගාස්තු අය කිරීම;

(ක) මුදල් හෝ අන්‍යාකාරයකින් වූ ත්‍යාග, ප්‍රදාන, පරිත්‍යාග, හෝ සහනාධාර පිළිගැනීම සහ අධිකාරියේ පරමාර්ථ කිසිවක් කරගෙන යාම සඳහා ඒවා යෙදවීම ;

(ග) මාර්ග පිළිබඳ සැලසුම්, නිර්මාණ, ඉදිකිරීම, නඩත්තු සහ ක්‍රියාත්මක කිරීම ආදිය ආවරණය සඳහා විධිමත් වැඩසටහන් සම්පාදනය කිරීම පිණිස විධිමත් මණ්ඩල පිහිටුවීම ;

(ච) මාර්ගයක, මහා මාර්ගයක හෝ ජාතික මහා මාර්ගයක මාර්ග රක්ෂිතයක් යම් උපයෝගිතා සේවා සපයන්නයකු භාවිතා කිරීම වෙනුවෙන් ගාස්තු හෝ කුලියක් අයකිරීම සහ ඒ කාර්යයන් සඳහා අවශ්‍ය විය හැකි පරිදි ගිවිසුම්වලට එළඹීම ;

(ජ) යම් මාර්ග රක්ෂිතයක්, මහා මාර්ග රක්ෂිතයක් හෝ ජාතික මාර්ග රක්ෂිතයක් දැන්වීම් ප්‍රදර්ශනය, බැනර් ප්‍රදර්ශනය, පුවරු හෝ විශාල දැන්වීම් පුවරු සවි කිරීම සඳහා හෝ වෙනත් යම් වානිජ කාර්යයක් සඳහා පාවිච්චි කිරීම හෝ එකී කාර්යයන් සඳහා යම් ව්‍යුහයක් ඉදිකිරීම වෙනුවෙන් යම් තැනැත්තකුගෙන් හෝ ආයතනයකින් ගාස්තු අය කිරීම සහ එකී කාර්යයන් සඳහා අවශ්‍ය විය හැකි ගිවිසුම් වලට එළඹීම ; සහ

(ට) මේ පනත යටතේ එහි බලතල, කාර්යයන් සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ සිදු කිරීම සඳහා ආනුෂංගික හෝ හිතකර වෙනත් යම් සියලු ක්‍රියා හෝ දේවල් සිදු කිරීම.

(2) යම් සංවර්ධන ප්‍රදේශයක් ඇතුළත මාර්ග සැලසුමක් සහ මාර්ග සංවර්ධනයට අදාළ යම් වැඩසටහනක් හෝ සංවර්ධන කටයුත්තක් ක්‍රියාත්මක කිරීම සඳහා (1) වන උපවගන්තිය යටතේ ස්වකීය බලතල, කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී සහ කිරීමේ දී අවස්ථාවෝචිත පරිදි අදාළ රාජ්‍ය දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, පළාත් සභාව සහ පළාත් පාලන ආයතනය විමසා, එකී වැඩසටහන හෝ සංවර්ධන කටයුත්ත ක්‍රියාත්මක කිරීම අධිකාරියේ කාර්යය විය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ජ) ඡේදයේ සඳහන් තැනැත්තා හෝ ආයතනය එකී ඡේදයේ සඳහන් යම් කාර්යයක් ආරම්භ කිරීමට පෙරාතුව අධිකාරියේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) “සාමාන්‍යාධිකාරි” යන වචනය ඒ වගන්තියේ සඳහන් වන සෑම අවස්ථාවක දීම ඒ වෙනුවට “අධ්‍යක්ෂ - ජනරාල්වරයා” යන වචනය ආදේශ කිරීමෙන්;

(2) එය (2) වන උපවගන්තියේ "ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන්" යන වචන වෙනුවට "ප්‍රතිපත්තිමය කාරණා සහ ක්‍රමෝපායක් සම්බන්ධයෙන්" යන වචන ආදේශ කිරීමෙන්.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

"අධිකාරියේ ණය ගැනීමේ බලතල. 15. (1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව සහ අමාත්‍යවරයාගේ ලිඛිත කැමැත්ත ඇති ව, අධිකාරිය විසින් මේ පනතේ කාර්යය ඉටුකිරීමේ දී වූ යම් බැඳීම් සපුරාලීම සඳහා අවශ්‍ය වන්නා වූ මුදල් පහත දැක්වෙන ආකාරයට ණයට ගැනීම හෝ සපයා ගැනීම කරනු ලැබිය හැකිය:—

(අ) තාවකාලික බැංකු අයිරා හෝ වෙනත් ආකාරයකට ; හෝ

(ආ) ණයකර සහ බැඳුම්කර හෝ විකුණුම් ණයකර මගින්.

(2) (1) වන උපවගන්තිය යටතේ අධිකාරිය විසින් ලබාගෙන ඇති යම් ණය මුදලක හෝ අරමුදලක ගෙවා අවසන් නොවන්නා වූ මුලු මුදල අමාත්‍යවරයා විසින් මුදල් විෂය භාර ප්‍රධාන අමාත්‍යවරයා විමසා නිශ්චය කරනු ලබන මුදල් ප්‍රමාණයකට වඩා කිසිම අවස්ථාවක වැඩි නොවිය යුතු ය.".

**7.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.